කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : 06 WW/TC/21/05/24/06

වර්ණය : ඇම්බර්


# ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිතව වර්ධනය වී ඇති ගැඹුරු පීඩන අවපාතය පිළිබඳ අවවාදාත්මක නිවේදනය


කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 මැයි මස 24 වන දින පෙ.ව. 08.30 ට නිකුත් කරන ලදී.

## දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

## සැලකිලිමත් වන්න!

- ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශයේ පැවති පීඩන අවපාතය තත්ත්වය මේ වන විට ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී මැයි 23 වන දින(ඊයේ) රාත්‍රී 11.30 වන විට උතුරු අක්ෂාංශ 16.3 සහ නැගෙනහිර දේශාංශ 89.7 ප්‍රදේශයේ ස්ථානගතව පැවති අතර එය මැයි 24 වන විට සුළි කුණාටුවක් දක්වා වර්ධනය වෙමින් ඊළඟ පැය 24 තුල චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වනු ඇතැයි බලාපොරොත්තුවේ. මෙම පද්ධතිය උතුරට බරව වයඹ දිශාවට ගමන් කර මැයි 26 වන දින වනවිට බටහිර බෙංගාල වෙරළ වෙත ගමන් කිරීමට බොහෝ දුරට ඉඩ ඇත.




## පද්ධතියේ ගමන් මාර්ගය පිළිබඳ අනාවැකිය

| දිනය/ වේලාව (ශ්‍රී. ලං. ස. වේ.)(පැය) | පිහිටීම ( අක්ෂාංශ/ දේශාංශ) | උපරිම සුළං වේගය ( පැ.කි.මී) | වර්ගය |
|---|---|---|---|
| 23.05.21/23.30 | 16.3 N/89.7 E | 55-65 , 75 දක්වා වැඩි විය හැක | ගැඹුරු පීඩන අවපාතය |
| 24.05.21/05.30 | 17.0 N/89.6 E | 70-80, 90 දක්වා වැඩි විය හැක | සුළි කුණාටුව |
| 25.05.21/11.30 | 18.5 N/88.7 E | 120-130, 145 දක්වා වැඩි විය හැක | චණ්ඩ සුළි කුණාටුව |

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**අනතුරු ඇඟවීම්:**

- **එබැවින්, ඉදිරි දින කිහිපයේ දී, උතුරු අන්දමන් සහ ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශය, නිරිත දිග බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශ වල ගිගුරුම් සහිත වැසි සමග විටින් විට වැඩිවන තද සුළං ( පැ.කි.මි. 50-60 සහ විටින් විට පැ.කි.මි. 70-80 දක්වා වන තද ප්‍රහාරාත්මක සුළං) හේතුවෙන් රළු හෝ ඉතා රළු මුහුදු ප්‍රදේශ අපේක්ෂා කළ හැක.**

- **ඉහත පද්ධතියේ බලපෑම හේතුවෙන්, ඉදිරි දින කිහිපයේදී දිවයින වටා වන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශ වල තද වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැකි අතර සුළං වේගය ක්ෂණිකව (පැ.කි.මී. 50-60 දක්වා පමණ) ඉහළ යන බැවින් එම මුහුදු ප්‍රදේශය විටින් විට රළු වේ.**

- **පුත්තලම සිට කොළඹ, ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන වෙරළබඩ ප්‍රදේශ වල මුහුදු රළ මීටර් (2.5-3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතින අතර මේ හේතුවෙන් මුහුදු රළ ගොඩ බිමට පැමිණීමේ හැකියාවක් ද පවතී.**

**අනුගමනය කල යුතු ක්‍රියාමාර්ග:**

- **නැවත දැනුම් දෙන තුරු, ඊසාන දිග බෙංගාල බොක්ක ආශ්‍රිත මුහුදු ප්‍රදේශය තුල (08N-20N, 83E-100E) සහ නැවත දැනුම් දෙන තුරු, දිවයින වටා වන මුහුදු ප්‍රදේශය තුල ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.**

- **දැනට මෙම මුහුදු ප්‍රදේශවල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස හැකි ඉක්මනින් ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.**

- **ධීවර හා නාවුක ප්‍රජාව මේ සම්බන්ධයෙන් නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

ශ්‍රීමාල් හේරත්
කාලගුණ විද්‍යාඥ,
ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

Bulletin No: **06** WW/TC/21/05/24/06
COLOR: **Amber**


# Advisory for the Deep Depression in the East Central Bay of Bengal


Issued by the Natural Hazards Early Warning Centre
Issued at 08.30 a.m 24 May 2021

## For the deep and shallow sea areas around the island

## PLEASE BE AWARE!

- The depression located in East Central Bay of Bengal has intensified in to a deep depression and lay centered near latitude 16.3N longitude 89.7E, yesterday 23rd may around 11.30 p.m. This system is very likely to intensify into a cyclonic storm by 24th and further into a severe cyclonic storm during subsequent 24 hours. It is very likely to move north-northwestwards and reach near west Bengal coasts around 26th May.




**Forecast track and intensity are given in the following table**

| Date/Time (SLST) (Hrs) | Position (Lat. / Long) | Maximum wind speed (Kmph) | Category of cyclonic disturbance |
|---|---|---|---|
| 23.05.21/23.30 | 16.3 N/89.7 E | 55-65 gusting to 75 | Deep Depression |
| 24.05.21/05.30 | 17.0 N/89.6 E | 70-80 gusting to 90 | Cyclonic Storm |
| 25.05.21/11.30 | 18.5 N/88.7 E | 120-130 gusting to 145 | Very Severe Cyclonic Storm |

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## Fisherman warning:

- Sudden roughness of the sea associated with strong winds **(50-60 kmph, up to 70-80 kmph** gusty wind at times) during thundershowers are expected over the North Andaman sea and adjoining east central Bay of Bengal and deep sea area of southwest Bay of Bengal during next few days.
- Possibility for heavy showers or thundershowers and sudden roughness, associated with sudden increase of wind speed up to **50-60 kmph** is high in deep and shallow see areas around the island during next few days.
- There is a possibility that near shore sea areas off the coast extending from Puttalam to Galle via Colombo may experience surges due to the effect of swell waves, having (2.5-3.0) m height.

## ACTION SUGGESTED:

- Naval and fishing communities are advised not to venture into the East Central Bay of Bengal and adjoining area **(08N-20N, 83E-100E)**, and sea areas around the island until further notice.
- Those who are in aforementioned sea areas are advised to return to coasts or moved safer areas as soon as possible.
- **Fishing and naval community are requested to be attentive regarding future forecasts issued in this regard.**

Srimal Herath

Duty Meteorologist
National Meteorological Center